Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණ



# ගණිත ඔලිම්පියාඩ් තරගාවලිය – 2024

## පළාත් මට්ටමේ පුහුණු සංචිතයට තෝරා ගැනීමේ පරීක්ෂණය

## මධ්‍යම පළාත

**පොදු උපදෙස්**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න
- එක් එක් ප්‍රශ්නය යටතේ ඇති තිත් ඉර මත පිළිතුරු සැපයිය යුතු අතර **ඒකක සඳහන් කළ යුතු අවස්ථාවල** අනිවාර්යයෙන්**ම පිළිතුරු යටතේ ඒකක සඳහන් කළ යුතු බව සලකන්න**
- රූප සටහන් ඇඳ ඇත්තේ පරිමාණයට නොවේ
- කාලයඃ- පැය **එකයි**


විභාග අංකයඃ- ..........................................

නම : ..........................................

පාසල : ..........................................

පන්තිය : ..........................................

1) පහත ප්‍රහේලිකාවේ හිස්තැන සඳහා ගැළපෙන කුඩාම අගය කුමක් ද?




පිළිතුර: ................................

2) 30 m දිග කම්බියකින් $1\frac{2}{5}$ m ක් දිග කැබලි කපනු ලැබේ. ඉතිරි වන කම්බි කොටසේ දිග කීය ද?

පිළිතුර : ................................

3) $a \oplus b = \frac{a+b\times b-b}{2}$ නම් $5 \oplus 3$ හි අගය සොයන්න.

පිළිතුර: ................................

4) සංඛ්‍යා තුනකින් පමණක් ඉතිරි නැතිව බෙදෙන කුඩාම ඉලක්කම් තුනේ සංඛ්‍යාව කුමක් ද?

පිළිතුර: ................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

5) 0, 3, 4, හා 5 යන එක් එක් ඉලක්කම එක් වරක් පමණක් බැගින් භාවිත කර සෑදිය හැකි ඉලක්කම් හතරේ සංඛ්‍යා ගණන කීය ද?


පිළිතුර : ................................

6) පහත ප්‍රකාශනය සුළු කරන්න.

$$\frac{10\times10\times10\times10\times10\times10\times10\times10\times10\times10-1}{10\times10\times10\times10\times10\times10\times10\times10\times10}$$

පිළිතුර: ................................

7) රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීය ද?



පිළිතුර: ................................

8) *A* x *PQR* = *PQRPQR*. මෙහි *P*, *Q*, *R*. අකුරු වලින් ඉලක්කම් තුනක් ද *A* මගින් සංඛ්‍යාවක් ද දැක්වේ. *A* සංඛ්‍යාවේ ඇති ඉලක්කම්වල එකතුව කීය ද?

පිළිතුර : ................................

9) සංඛ්‍යාවක් 55 න් බෙදූවිට ශේෂය 34 කි. එම සංඛ්‍යාව 11න් බෙදූ විට ශේෂය කීය ද?

පිළිතුර: ................................

10) *A*, *B*, *C*, හා *D* භාජනවල ඇති සිසිල් බීම ප්‍රමාණ පිළිවෙළින් 492 ml, 498 ml, 438 ml හා 472 ml වේ. පිටතින් සිසිල් බීම නොගෙන මෙම භාජනවල ඇති බීම ප්‍රමාණ සමාන කිරීමේ දී භාජනයකට දැමීමට හෝ භාජනයෙන් ඉවතට ගැනීමට හෝ සිදුවන අවම සිසිල් බීම පරිමාව සොයන්න.

පිළිතුර: ................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

11) ඉලක්කම් තුනේ සංඛ්‍යාවක ඉලක්කම්වල ගුණිතය 8 කි. එලෙස පවතින විශාලතම හා කුඩාම සංඛ්‍යා අතර වෙනස සොයන්න.

පිළිතුර : ……………………………

12) සමාන දිගැති ඉරටු කැබලි වලින් සාදන ලද රටාවක පළමු පියවර තුන පහත දැක්වේ. ඉරටු කැබලි 115 ක් භාවිතයෙන් සෑදිය හැකි රටාවේ උපරිම පියවර ගණන කීය ද?



1 පියවර 2 පියවර 3 පියවර

පිළිතුර : ……………………………

13) පහත ගුණිතයෙහි පිළිතුරෙහි අවසන් ඉලක්කම් දෙක මොනවා ද?

$5 \times 25 \times 125 \times 625 \times 3125$

පිළිතුර : ……………………………

14) 53, 54, 27, 28, …

ඉහත සංඛ්‍යා රටාව පහත කොන්දේසි අනුව ගොඩනගා ඇත.

- අගය ඔත්තේ නම් එයට එකක් එකතු කර ඊළග පදය සාදනු ලැබේ.
- අගය ඉරට්ටේ නම් එය දෙකෙන් බෙදා ඊළග පදය සාදනු ලැබේ.

මෙම රටාවේ 50 වෙනි පදය සොයන්න.

පිළිතුර : ……………………………

15) පැතුම් T-20 තරගයක දි මුහුණ දුන් පළමු පන්දු දහයෙන් සෑම පන්දුවකටම 6, 4, 3, 2, හා 1 පහර අවම වශයෙන් එක බැගින් එල්ල කර ලකුණු 25 ක් ලබා ගත්තේය. ඔහු එල්ල කර ඇති උපරිම හතරේ පහර ගණන කීයක් විය හැකි ද?

පිළිතුර : ……………………………

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

16) කසුන්ගේ හා දසුන්ගේ වයස්වල එකතුව අවුරුදු 28 කි. දසුන්ගේ හා පසන්ගේ වයස්වල එකතුව අවුරුදු 32 කි. කසුන්ගේ හා පසන්ගේ වයස්වල එකතුව අවුරුදු 36 කි. කසුන්ගේ වයස කීය ද?

පිළිතුර : ................................

17) එකිනෙකට වෙනස් ඉලක්කම් දෙකේ පූර්ණ සංඛ්‍යා දෙකක එකතුව 50 කි. එම සංඛ්‍යා දෙකේ ගුණිතය සඳහා ගත හැකි වැඩිම අගය කීය ද?

පිළිතුර : ................................

18) පහත ප්‍රකාශනයේ අගය සොයන්න.

$$\frac{1}{2}-\frac{1}{4}+\frac{1}{6}-\frac{1}{8}+\frac{1}{10}-\frac{1}{12}$$

පිළිතුර : ................................

19) සමීර පොතකින් $\frac{1}{6}$ ක් සඳුදා දින ද, එමෙන් දෙගුණයක් අඟහරුවදා දින ද, ඉතිරියෙන් $\frac{2}{3}$ ක් බදාදා දින ද, සඳුදා කියවන ලද ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් බ්‍රහස්පතින්දා දින ද කියවන ලදි. බ්‍රහස්පතින්දා දිනය අවසන් වන විට ඔහු පොතෙන් කියවා තිබුණු ප්‍රමාණය කොපමණ ද?

පිළිතුර: ................................

20) අනුයාත ත්‍රිකෝණ සංඛ්‍යා හතරක එකතුව ඉලක්කම් තුනේ සමචතුරස්‍ර සංඛ්‍යාවකි. එලෙස පැවතිය හැකි කුඩාම ඉලක්කම් දෙකේ ත්‍රිකෝණ සංඛ්‍යාව කුමක් ද?

පිළිතුර : ................................